# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,492 - 2026 ජුනි මස 05 සිකුරාදා - 2026.06.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 142 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


*සැ. යු. -* ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත 2026.06.05 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජුනි මස 26 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජුනි මස 12 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

**බලංගොඩ සුළු හිමිකම් අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

විදානෙ පතිරණගේ ඉංදික ලක්මාල් පතිරණ,
උඩ වීදිය,
අලුත් නුවර,
ඉඹුල්පේ.

නඩු අංකය : 59
ස්වභාවය : සුළු හිමිකම්
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම :

*............පැමිණිලිකරු.*

*එදිරිව*

ලක්ෂපති විදානලාගේ දනුක ප්‍රසාද් කුමාර ද මෙල්,
අංක 7/3,
වැලිගරණාව පාර,
කිරිදිගල,
බලන්ගොඩ.

*...........විත්තිකරු.*

ඉහත සඳහන් නඩුවේ වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 01 දින ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය ප්‍රකාරව ඉහත නම් සඳහන් විත්තිකරුට එරෙහිව පැමිණිලිකරුට පහත සඳහන් සහන ලබාගත හැකි බවට තීන්දු කර ඇත.

(අ) රුපියල් 114,000.00 මුදල, නඩු පැවරූ දින සිට රුපියල් ලක්ෂයක (රු. 100,000.00) මුදල මත තීන්දු ප්‍රකාශයේ දින දක්වා නෛතික පොළිය අයකර ගැනීම.

එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති දේපළ තහනමට ගෙන විකිණීමේ ඇස්කිසියේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරු සතු චංචල දේපළ,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 10 දින ප. ව. 2.00 ට,**

බලන්ගොඩ, කිරිදිගල, වැලිහරනාව පාර, අංක 7/3 දරන ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

I. කුෂන් පුටු සෙට් 01
II. වීදුරු TV ස්ටෑන්ඩ් 01
III. ලී මේස අඩි 2x4
IV. සිසිල් වර්ගයේ ස්ටෑන්ඩ් ෆෑන් 01
V. පොඩි ලී මේස 01
VI. W:11247720203027330 Whirlpool ෆ්‍රිජ් 01
VII. අහල් 6x45 දොර 02 වානේ අල්මාරි 01
VIII. ගෑස් ලිප් 02
IX. ලාෆ් ගෑස් සිලින්ඩර් 01
X. සිංගර් වර්ගයේ බ්ලෙන්ඩර් 01
XI. පිඟන් රාක්ක 02
XII. පොත් රාක්ක 01

ඒ. ඩී. සූරවීර,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සුළු හිමිකම් අධිකරණය,
බලංගොඩ.

06 - 47

**ගම්පහ දිසා අධිකරණ බල ප්‍රදේශයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

*...........පැමිණිලිකරු.*

ගම්පහ දිසා අධිකරණයේ
නඩු අංකය : MB/116
ගම්පහ දිසා අධිකරණයේ
ඇස්තීසි අංක : 04/2026

*එදිරිව*

1. කේ. එන්. වික්‍රමරත්න,
වැලිවේරිය, නැදුන්ගමුව පාර,
රුජිණා ලී බඩු වෙළඳසැල වන නාමය සහ විලාසම යටතේ
තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යනු ලැබේ.

2. එච්. ටී. එම්. ක්‍රිෂාන්ති පීරිස්,
නැදුන්ගමුව පාර, වැලිවේරිය.

*..........විත්තිකරුවන්.*

මෙම නඩුවේ වර්ෂ 2014 ක් වූ මාර්තු මස 04 දින දරන තීන්දු ප්‍රකාශය ප්‍රකාශයට පත්කර අනුමත වී ඇති හෙයින් එකී තීන්දු ප්‍රකාශය ප්‍රකාරව, පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි, එනම් -

(*අ*) රු. 2,230,979.23 ක් වූ මුදල සහ 2011.03.01 දින පටන් මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය දක්වා එයින් රු. 1,593,667.00 සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළ කරනු ලබන, බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්.පී. ආර්.) වර්ෂයකට 7% ක් ඉහළ අනුපාතිකයක් වන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකයක් මත පොළිය ද සහ ව්‍යවස්ථාපිත ගාස්තු ගෙවන ලෙස නඩු තීන්දුවක් හා තීන්දු ප්‍රකාශයක් ලබා දෙන ලෙස ;

(*ආ*) මෙහි උපලේඛනයේ විස්තර කර තිබෙන සම්පූර්ණ දේපළ හා පරිශ්‍රය, එහි පිහිටි සියලු ගොඩනැගිලි, සවිකරු එම දේපළට හිමි මාර්ග අයිතිවාසිකම් සහ සෑම සියළු අනුබන්ධන ද, සමග සහ එම ඉඩමට හා පරිශ්‍රයට එය කෙරෙහි හෝ එයින් 1 සහ 2 විත්තිකරුවන් සතු කවර වූ හෝ බුදල් හිමිකම්, අයිතිවාසිකම්, හිමිකාරත්ව, සම්බන්ධතා දේපළ හිමිකම් සහ ඉල්ලුම් ඉහත සඳහන් මුදල් අයකර ගැනීම සඳහා ගම්පහ දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් තහනමට ගන්නා ලද පැමිණිල්ලේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2026 ක්වූ ජූලි මස 20 දින ප. ව. 2.00ට,**

එම දේපළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, නැදුන්ගමුවේ පිහිටි, දෙල්ගහවත්ත නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඒ. ජී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 305 හා 1992.01.09 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 'ඒ' ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන -

උතුරු නැගෙනහිරට : ලොට් 'බී' දරන බිම් කට්ටිය ද ; දකුණු-නැගෙනහිරට : පාර ද; දකුණු-බස්නාහිරට : ඩබ්ලිව්. ලුවිස් ද මෙල්ට අයිති ඉඩම සහ කේ. මේරි මාග්‍රට් පෙරේරාට අයිති ඉඩම ද; උතුරු-බස්නාහිරට : කේ. මේරි මාග්‍රට් පෙරේරාට අයිති ඉඩම ද, යන මායිම් ඇතුළත පර්චස් විසිනවයක් (පර්. 29) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ හා ඉහත කී අංක 305 දරන පිඹුරේ දැක්වෙන මාර්ග ප්‍රයෝජනයට ගැනීමේ හිමිකම් ද වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ප. 860/19 සහ පි 680/58 දරන වෙලුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

එච්. එන්. ජයන්ති මැණිකේ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ගම්පහ.

වර්ෂ 2026 ක් වූ මැයි මස 21 දින දී ය.

06 - 50

**ගම්පහ දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

නඩු අංකය : 562/MB
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 4,301,579/60
කාර්ය පටිපාටිය : සාමාන්‍යය
ඇස්කිසි අංකය : 123/2024

කිරිබත්ගොඩ, නුවර පාරේ, අංක 134, "කිරිබත්ගොඩ ශාඛාව" යනුවෙන් සඳහන් කරන හා හඳුන්වනු ලබන, ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාර ස්ථානයක් ඇත්තා වූ කොළඹ 01, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත, අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී.

*...........පැමිණිලිකරු.*

*විරුද්ධව*

කොළඹගේ දොන් ඉන්දික පුෂ්පකුමාර,
අංක 201/2D, මාකොළ උතුර, මාකොළ.

*..........විත්තිකරු.*

වර්ෂ 2022 ක් වූ අගෝස්තු මස 29 දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

ඒ අනුව මෙම නඩුව සඳහා ඉදිරිපත් කර ඇති ලේඛනවලට අනුව විත්තිකරු විසින් පැමිණිලිකාර ආයතනය වෙත එකඟ වන ලද පරිදි ප්‍රධාන ණය මුදල වශයෙන් රු. 2,351,629.82 ක මුදලක් සහ ණය මුදලේ පොලිය වශයෙන් රු. 660,653.58 ක මුදලක් සහ ගෙවීමට නියමිතව ඇති ප්‍රධාන මුදල වන රු. 2,351,629.82 ක මුදලක් ද එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තුරු නෛතික පොළිය ද අයකර ගැනීමට පැමිණිලිකාර ආයතනයට හිමිකමක් ඇති බවට මෙයින් නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද ;

තව ද, විත්තිකරු විසින් එකී ණය මුදල නොගෙවන්නේ නම් ණය මුදලට සුරැකුමක් ලෙස තබා ඇති පැමිණිල්ලේ සහ මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති එකී උකස් දේපළ වෙන්දේසි කොට අදාළ මුදල අයකර ගැනීම සඳහා පැමිණිලිකාර ආයතනයට හිමිකමක් ඇති බවටත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද ;

තීන්දු ප්‍රකාශයේ සහ මෙහි වූ උපලේඛණයේ විස්තර කර ඇති ඉඩම හා පරිශ්‍රය ඉහත කී මුදල් ප්‍රමාණයන් අයකරගැනීම සඳහා බැඳී පවතින බවට හා ක්‍රියාවේ යෙදවිය හැකි බවටත් නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද ;

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් - ඩී. කේ. එන්. වික්‍රමආරච්චි විසින් 2024.08.26 දින තහනම් කරන ලද පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී,

**වර්ෂ 2026 ක්වූ ජූලි මස 15 දින පෙ. ව. 11.00 ට,**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත 270බී, මාකොළ උතුර ග්‍රාම නිලධාරි වසම තුළ බියගම ප්‍රාදේශීය සභා සීමාවේ මාකොළ උතුරු පිහිටා ඇත්තා වූ "කජුගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. සී. කොතලාවල විසින් සාදන ලද අංක 163/89 හා 1989.09.29 දින දරන පිඹුරේ නිරූපිත අංක 3 බිම් කැබැල්ල වශයෙන් සළකුණු කොට ඇති නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි ගොඩනැගිල්ල, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේ ද සමග වේ. එකී අංක 3 බිම් කැබැල්ලට මායිම් උතුරින් : අංක 01 බිම් කැබැල්ලෙන්; නැගෙනහිරින් : ප්‍රේමසිරි ඩබ්ලිව්. සිරිසේන හා ජී. ඩී. මහින්දසෝමට අයත් ඉඩම්වලින් ; දකුණින් : කරත්ත පාරෙන් ; සහ බස්නාහිරින් : අංක 02 බිම් කැබැල්ලෙන් මායිම් වූ ද, එකී අංක 163/89 දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම බිංදුවයි එකකින් (පර්. 13.01) යුක්ත වූ බිම් කැබැල්ල වේ. මෙය ගම්පහ ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයෙන් N 94/16 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කැබැල්ල මැතක දී කරන ලද මැනීමක දී පහත සඳහන් පරිදි විස්තර කර ඇත :-

ඉහත කී මාකොළ උතුර පිහිටා ඇත්තා වූ "කජුගහවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ලෙස්ලි එන්. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 5374 හා 2012.02.13 දින පිඹුරේ නිරූපිත අංක 3ඒ බිම් කැබැල්ල වශයෙන් සළකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල වේ. ඊට මායිම් උතුරින් : ප්‍රිසිට අයත් ඉඩමෙන් ; නැගෙනහිරින් : කොන්සිට (කලින්) හා වෙනත් තැනැත්තන්ට අයත් ඉඩමෙන් ; දකුණින් : පාරෙන් (ප්‍රාදේශීය සභා) ; සහ බස්නාහිරින් පෞද්ගලික පාරෙන් මායිම් වූ ද, එකී අංක 5374 දරන පිඹුර අනුව ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම බිංදුවයි එකකින් (පර්. 13.01) *නැතහොත්* හෙක්ටයාර් 0.0329 කින් යුක්ත වූ බිම් කැබැල්ල වේ.

*ඉඩමට පිවිසීම.*- කිරිබත්ගොඩ නගර මධ්‍යයේ සිට මාකොළ පාරේ කිලෝමීටර් 2ක් පමණ ගමන් කර දේවාල පාරට වමට හැරී මීටර් 25ක් පමණ ගමන්කර පන්සල පාරට දකුණට හැරී තුංමං හන්දිය දක්වා ඒ පාරේ මීටර් 100ක් පමණ ගමන් කර දකුණට හැරී එම පාරේ මීටර් 75ක් පමණ ගමන් කළ විට (පන්සල් පරිශ්‍රය පසු කර මීටර් 25ක් පමණ) විෂයගත ඉඩම ඒ පාර අභිමුඛව දකුණු අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් නියෝජ්‍ය පිස්කල් වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ :-

(1) ගැනුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ක් දේපළ මිලදී ගත් වහාම ගෙවිය යුතු වන අතර, ඉතිරි 75%ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය ;

(2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය අනුව ගැනුම්කරු විසින් ගැනුම් මිලෙන් පළමු රු. 7,500/- සඳහා රු. 150/-ක ගාස්තුවක් ද රු. 7,500/- ඉක්මවන සෑම රු. 1,000 ක් සඳහාම රු. 5 බැගින් පිස්කල් ගාස්තු සහ විකුණුම් සඳහා වන සියලුම වියදම් ගෙවිය යුතු ය.

රෙජිස්ට්‍රාර්/පිස්කල්,
දිසා අධිකරණය,
මහර.

06 - 49

---

**තිස්සමහාරාම දිසා අධිකරණයේ දී ය**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී,
අංක 21, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත, (කලින් බ්‍රිස්ටල් වීදිය යනුවෙන් හඳුන්වන ලදී.)
කොළඹ 01.

*............පැමිණිලිකරු.*

නඩු අංකය : 01/2012/MB
මුදල : රු. 5,413,652.07
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
ස්වභාවය : උකස්බැඳුම්කරය

*විරුද්ධව*

1. සුජීව පුෂ්පකුමාර සමරසිංහ
2. උදය කුමාර සමරසිංහ

*දෙදෙනාම :*

අංක 04, "ජයබිම", සඳගිරිගොඩ, තිස්සමහාරාමය.

*...........විත්තිකරු.*

වර්ෂ 2015 ක් වූ ජුනි මස 25 දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

ඒ අනුව පැමිණිල්ලේ ආයාචනයේ (අ) ඡේදයේ අයැද ඇති පරිදි,

ඉහත නම සඳහන් 1 හා 2 විත්තිකරුවන් විසින් ගෙවීම හිඟ තබා ඇති ප්‍රාග්ධන මුදල වන රු. 2,093,500/- ක මුදලක් ඒ මුදල මත 2012 මැයි මස 17 දින දක්වා රු. 3,320,152/07 ක පොළිය හා රු. 2,093,500/- ක් වූ එකී ගෙවීම හිඟ තබා ඇති ප්‍රාග්ධන මුදල මත 2012 මැයි මස 18 දින සිට ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් වර්ෂයකට 28%ක වැඩිපුර පොළිය ගෙවිය යුතු බවට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද ;

තව ද, ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට අධිකරණයේ නිලධාරියකු විසින් නියමිත පරිදි තක්සේරු කරනු ලබන මෙම නඩුවේ නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද ;

ඒ තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මාස දෙකක් ඇතුළත අධිකරණය විසින් තීන්දු ප්‍රකාශිත පරිදි එකී නඩු නිමිත්ත මත අයවීමට තිබෙන ඉහත කී මුදල් පොලිය හා නඩු ගාස්තු ගෙවීම පැහැර හරිනු ලැබීමේ දී තීන්දු ප්‍රකාශයේ සහ මෙහි වූ උපලේඛනයේ විස්තර කර ඇති එකී ඉඩමේ උකස්කරුවන් වන සුජීව පුෂ්පකුමාර සමරසිංහ සහ උදය කුමාර සමරසිංහ සතු සියලු අයිතිවාසිකම් හිමිකම් හා සම්බන්ධතා ද අධිකරණය විසින් පත් කරනු ලබන වෙන්දේසිකරුවකු මගින් ප්‍රමාණවත් යයි එකී වෙන්දේසිකරු සළකන යථා පරිදි දැන්වීමකින් පසුව අධිකරණය විසින් අනුමත කරන ලද විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට නියෝග කර තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද ;

උකස් කරන ලද දේපළ පළමුව එකී තක්සේරු කරන ලද වටිනාකමේ මුදලට විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසට හා ඒ වටිනාකමේ මුදලට ලංසු තබන්නන් කිසිවකු නොවුවහොත් අධිකාරිය නිකුත්කරන ලද අවස්ථාවේ දී ඒ තීන්දු ප්‍රකාශයේ මුදලට හා ඒ විකිණීමේ දී ද ලංසු තබන්නන් කිසිවෙකු නොවුවහොත් ඒ විට ඉක්බිතිව සිටින ඉහළම ලංසු තබන්නා වෙත විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසට හා පැමිණිලිකරුට හෝ පැමිණිලිකරු වෙනුවෙන් වෙනත් තැනැත්තකුට ඒ විකිණීමේ දී මෙහි වූ උපලේඛනයේ වඩාත් සවිස්තරව විස්තර කර ඇති එකී උකස් කරන ලද දේපළ සඳහා ලංසු තබා මිළදී ගැනීමට ඉඩ දෙන ලෙසට හා පැමිණිලිකරු ඒහි ගැනුම්කරු වී නම් පැමිණිලිකරුගේ හිමිකම් පෑම් වල පොළියේ හා නඩු ගාස්තුවල ප්‍රමාණය හිලව් කර ගැනීමට පැමිණිලිකරුට ඉඩ දෙන ලෙසට ද නියෝග කොට බලය පවරා ඇති හෙයින් ද ;

ඉහත සඳහන් නඩුවේ තීන්දු ප්‍රකාශයේ මුදල් අයකර ගැනීම පිණිස මෙම නඩුවේ විත්තිකරුවන් අපොහොසත් වී ඇති බැවින් පැමිණිළිකරුට අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා පහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ

වර්ෂ **2026** **ක් වූ ජූලි මස 16 දින පෙ. ව. 11.00 ට,**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රනකෙලිය උතුර ග්‍රාම නිලධාරි වසමේ, රනකෙලිය උතුර ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද ;

උතුරින් : එම ඉඩමේ අංක 3 බිම් කැබැල්ලෙන්; නැගෙනහිරින් : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් හිමිකම් දන්වා සිටින සඳගිරිගොඩ කුඹුරෙන් කොටසකින්; දකුණින් : එම ඉඩමේ ම අංක 05 බිම් කැබැල්ලෙන් ; හා බස්නාහිරින් : පාරෙන් මායිම් වූ ද ප්‍රමාණයෙන් පර්චස් පහළොවකින් (අ.0, රූඩ්.0, පර්.15) යුක්ත වූ ද හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C21/107 හිමිකම යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, සඳගිරිගොඩ යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් හා එයින් බලයලත් මිනින්දෝරු එච්. පී. ටී. ජයවර්ධන මහතා විසින් සකස් කරන ලද අංක 326 හා 1982.07.10 වැනි දින දරන පිඹුරේ අංක 4 බිම් කැබැල්ල වශයෙන් සළකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි පස, වැවිලි, ගොඩනැගිල්ල හා වෙනත් සියලු දේ ද සමග වේ.

ඉහත ඉඩම් මෑතකදී කරන ලද මැනීමක දී පහත සඳහන් පරිදි විස්තර කර ඇත :-

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම්පත්තුවේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සීමාවේ, රනකැටිය උතුරු (එෆ්. වී. පී. 630) ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, උතුරින් : එච්. ජී. සුමනලතා විසින් හිමිකම් දක්වා සිටින එම ඉඩමේම අංක 03 බිම් කැබැල්ලෙන්; නැගෙනහිරින් : කේ. කේ. සාලිය උදය කුමාර විසින් හිමිකම් දක්වා සිටින ඉඩමෙන්; දකුණින් : කේ. එල්. තිලක් විසින් හිමිකම් දක්වා සිටින එම ඉඩමේම අංක 05 බිම් කැබැල්ලෙන් හා බස්නාහිරින් : පාරෙන් මායිම් වූ ද ප්‍රමාණයෙන් පර්චස් පහළොවකින් යුක්ත වූ ද (පර්.15) හෙක්ටෙයාර් 0.0380 බලයලත් මිනින්දෝරු එච්. පී. ටී. ජයවර්ධන විසින් සකස් කරන ලද අංක 376 හා 1982.07.10 වැනි දින දරන පිඹුරේ අංක 4 බිම් කැබැල්ලේ නිරූපිත සඳගිරිගොඩ කොටසක් යනුවෙන් හා හඳුන්වනු ලබන ඉඩම් කැබැල්ලේ නැවත

මැනීමක් වන බලයලත් මිනින්දෝරු ඩබ්. ජී. ඩී. යූ. කරුණාරත්න විසින් සකස් කරන ලද අංක 3824 හා 2007.03.17 වැනි දින දරන පිඹුරේ A බිම් කැබැල්ල වශයෙන් සළකුණු කරන ලද බෙදා වෙන් කරන ලද හා නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටි පස, වැවිලි, ගොඩනැගිලි, වැවිලි හා වෙනත් සියලු දේ ද සමග වේ.

*ඉඩමට පිවිසීම.-* තිස්ස CBCL සිට කිරින්ද පාර ඔස්සේ කිරින්ද දෙසට මීටර් 450 ක් ගමන් කර වමට ඇති පන්සල පාරට හැරී "ස්තූප" දක්වා මීටර් 550 ගමන් කර දකුණට ඇති සඳගිරිගොඩ පාරට හැරී මීටර් 600ක් පමණ සඳගිරිසෑය පසුකර මීටර් 600ක් ගියවිට දකුණට විෂයගත දේපළ පිහිටා ඇත.

***ගෙවීම් ක්‍රමය :***

වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් නියෝජ්‍ය පිස්කල් වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ :-

(1) ගැනුම්කරුවන් විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%ක්) දේපළ මිල දී ගත් වහාම ගෙවිය යුතු වන අතර, ඉතිරි 75% මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.

(2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය අනුව ගැණුම්කරු විසින් ගැණුම් මිලෙන් පළමු රු. 7,500.00 සඳහා රු. 150.00 ක ගාස්තුවක් ද රු. 7,500.00 ඉක්මවන සෑම රු. 1,000.00 ක් සඳහාම රු. 5.00 බැගින් පිස්කල් ගාස්තු සහ විකුණුම් සඳහා වන සියලුම වියදම් ගෙවිය යුතු ය.

රෙජිස්ට්‍රාර්/පිස්කල්,
දිසා අධිකරණය,
තිස්සමහාරාමය.

වර්ෂ 2026 ක් වූ මැයි මස 16 වැනි දින දී ය.

06 - 44

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැළකිය යුතුයි.**- මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2026 වර්ෂය** | | | |
| **ජුනි** | 2026.06.05 | සිකුරාදා | 2026.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.06.12 | සිකුරාදා | 2026.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.06.19 | සිකුරාදා | 2026.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.06.26 | සිකුරාදා | 2026.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2026.07.03 | සිකුරාදා | 2026.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.10 | සිකුරාදා | 2026.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.17 | සිකුරාදා | 2026.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.24 | සිකුරාදා | 2026.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.31 | සිකුරාදා | 2026.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2026.08.07 | සිකුරාදා | 2026.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.14 | සිකුරාදා | 2026.07.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.21 | සිකුරාදා | 2026.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.28 | සිකුරාදා | 2026.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ප්‍රසන්න ජයරත්න,**
*රජයේ මුද්‍රණාලයාධිපති.*

2026 අප්‍රේල් මස 02 දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.